## 368 පවුරු බිඳන්

පවුරු බිඳන් වැට කඩුලු මැදින් – අඳුර බිඳන්
ලොව එළි කරවන් – ගිනිලව් // ලොව ගිනිලව්
දහමේ ගිනි දැල්ලෙන් – දැල්ලෙන් // දහමේ ගිනි දැල්ලෙන්
මිනිස් බවින් පිරි මිනිස් හදක් වෙත ජීවිත අර්ථය
පහදා දෙන්නට // පෙරටම එනවා // කිතු බැති ජනතාවෝ //

යුක්තිය සත්‍යය රජ කරවන්නට – මුදිතා කරුණා
අවිහිංසාවෙන් – සරසව් // ලොව සරසව්
කිතුදම් සංජීවෙන් – ජීවෙන් // කිතුදම් සංජීවෙන්
අසහන සිතුවම් බැහැර කරන්නට සහනා ලෝකය පැහැ
කරවන්නට // පෙරටම එනවා // කිතු බැති ජනතාවෝ //

තැලී පෙලී තෙරපෙන ජනතා – විමුක්ති සටනට
පිවිසෙනවෝ – එක්වව් // පෙරටම යව්
දිරිදුන් සමිඳුන් හා – සමිඳුන් // දිරිදුන් සමිඳුන් හා
පීඩිත ජනතා අතරම තෙරපී විමුක්ති සටනට
අත දෙනවෝ // පෙරටම එනවා // කිතු බැති ජනතාවෝ //

වංශයෙ පංතියෙ දූලි ගසා බිඳ – මිනිස් බවේ
ගුණ කිරුළ හොවාගෙන – පිබිදෙව් // අද පිබිදෙව්
කිතිඳුන් දිවි ගෙවමින් – ගෙවමින් // කිතිඳුන් දිවි ගෙවමින්
පවු ඇලි අඳුරෙන් මිඳුනෝ අපි ආලෝකයෙ දිවි ලැබුවෝ
වෙනවෝ // පෙරටම එනවා // කිතු බැති ජනතාවෝ //